# සෙලුයිලොයිඩ් පටියේ රැඳුණු අතීත ශ්‍රී ලංකාව

## (ලක්දිව වාර්තා චිත්‍රපටයේ මුල් සප්තකය)

**ආචාර්ය උදිත ගයාෂාන් ගුණසේකර**

ලාංකික පිළිබිඹුව විදේශයනට ගමන් කළ වැදගත් ක්‍රමවේදයක් වන්නේ වාර්තා චිත්‍රපටකරණයයි. මෙරට වාර්තා සිනමා කලාවේ ආරම්භය විධිමත් ලෙස සලකුණු වන්නේ, තේ අලෙවිය පිණිස ප්‍රචාරය ලබාගැනීමේ උපක්‍රමයක් වශයෙන් 1935 දී 'ලංකා ගීතය' (Song of Ceylon) නිපදවීමත් සමගිනි.

මෙම චිත්‍රපටය නිපදවන ලද්දේ Empire Marketing Board ආයතනය වෙනුවෙන් වුව ද, එය නිම වන විට ආයතනය විසුරුවා හැර තිබූ බැවින් සමාප්තිය සිදු වූයේ බ්‍රිතාන්‍ය මහ තැපැල්හලේ (GPO) චිත්‍රපට ඒකකයේ ව්‍යාපෘතියක් වශයෙනි. පසුව Crown Films ආයතනය බවට පත් වූයේ මෙම ඒකකයයි. 'ලංකා ගීතය' බ්‍රිතාන්‍ය වාර්තා සිනමාවේ ඉතා ම දීප්තිමත් යුගයේ ඵලයක් වශයෙන් බිහි වූවකි. ආතර් නයිට් මෙය හඳුන්වන්නේ, ගීතවත් ශෛලිය අතින් සදාකාලයට ම නොනැසී පවත්නා වාර්තා චිත්‍රපටය වශයෙනි. එය බ්‍රිතාන්‍යය පුරා පැවැති චිත්‍රපට සංගම්හි සාමාජිකයින් පරිශීලනය කළ, වාර්තා සිනමාව පිළිබඳ අත්පොත් බඳු විය. [1]


බ්‍රිතාන්‍ය වාර්තා සිනමාවේ පුරෝගාමී ජෝන් ග්‍රියර්සන්ගේ උපදෙස් මත බැසිල් රයිට්, ජෝන් ටේලර් සහ වෝල්ටර් ලී යන ශිල්පීහු 1934 දී මෙරටට පැමිණ, කීර්තිධර ලාංකික ඡායාරූප ශිල්පී ලයනල් වෙන්ඩ්ට්ගේ ද සහය ඇති ව ලංකා ගීතයට රූපගත කිරීම් සිදු කළහ. සති 7 ක් මුළුල්ලේ නිශ්චිත පූර්ව සැලසුමකින් තොර ව සිදු වූ රූගත කිරීම් සංස්කරණය වූයේ බ්‍රිතාන්‍යයේ දී ය. එහි දී The Buddha, The Virgin Island, The Voice of Commerce, The Appeal of a God වශයෙන් කොටස් 4 කින් යුතු ව චිත්‍රපට ආකෘතිගත කෙරිණි. චිත්‍රපටයේ සෑම කොටසක් ම ඊට අදාළ ජන සංස්කෘතිය, පරිසරය හා සම්බන්ධ අතුරු දර්ශන උපයෝගී කොටගෙන, දේශීය සංගීතය හා ස්වාභාවික ශබ්ද ද සංකලනය කරමින්, මනා ජීව ගුණයකින් යුතු ව ගොඩනැගූ හෙයින් මෙය අද දක්වාත් ලෝකයේ සම්භාව්‍ය වාර්තා සිනමා කෘතියක් සේ

[1] අබේසේකර, තිස්ස, "ලංකා ගීතය වාර්තා සිනමාව සහ රජයේ චිත්‍රපට අංශය", රත්නභූෂණ, ඇෂ්ලි, සංස්: සිනෙසිත් අංක 5, ජාතික කතෝලික සිනමා පර්ෂදය, කොළඹ, 1986, පි. 01

බුහුමන් ලබයි. මෙතරම් චිත්‍රපට කලාව හා සම්බන්ධ පරමාදර්ශී කෘතියක් ලංකාව පදනම් කොටගෙන අද දක්වා ම බිහිවී නැතැයි පැවසීම අතිශයෝක්තියක් නොවේ.

චිත්‍රපට ව්‍යාකරණය ගැන 1950 දී ලන්ඩනයේ Faiber and Faber සමාගම මගින් ප්‍රකාශිත A Grammer of the Film නම් ග්‍රන්ථයට අනුව Song of Ceylon චිත්‍රපටයේ සෑම අංගයක් ම විශේෂ වූ අර්ථයන්ගෙන් සහ අලංකාරයෙන් අනූන වේ. එහි සැබෑ වටිනාකම සාක්ෂාත් වන්නේ මුල් ස්වරූපයෙන් ම ප්‍රසිද්ධ දර්ශනයට ඉදිරිපත් කිරීමට වඩා සිනමා සංගම්හි විද්‍යාර්ථීන් හමුවේ තිරගත කිරීමෙනි. [2]


මේ අනුව ලංකා ගීතය චිත්‍රපටය, එහි මූලික අභිප්‍රාය වූ තේ අලෙවිය පිළිබඳ ප්‍රචාරණ කාර්යය ඉක්මවා ගොස් ලෝක සිනමාවෙහි සුවිශේෂ මං සලකුණක් සනිටුහන් කළ බව පැහැදිලි ය. මතු දැක්වෙන්නේ, එහි නිර්මාණශීලී ගුණය පැහැදිලි වන සිනමා රූප රාමු කිහිපයකි.



චිත්‍රපටයේ ගලායෑම වඩා ක්‍රමවත් ලෙස ඉදිරිපත් කරනු වස්, මෙම පක්ෂියා තැනින් තැනට ඉගිලයාම කැමරාවෙන් අනුගමනය කරන බවක් ප්‍රේක්ෂකයාට හැඟවේ.



සිරිපා මුදුන් පුද පූජා




ගල් විහාරයේ බැතිමතෙක්

[2] Spottiswood, Raymond; A Grammer of the Film, 7th Printing, University of California Press, Loss Angeles, 1969, p. 92

ලංකා ගීතය කලුසුදු, මි.මී. 35
ධාවන කාලය මි. 41
නිෂ්පාදක ජෝන් ග්‍රියර්සන්
අධ්‍යක්ෂ, සංස්කාරක හා කැමරා ශිල්පී බැසිල් රයිට්
සහය අධ්‍යක්ෂ ජෝන් ටේලර්
සංගීතය වෝල්ටර් ලී
පටිගත කිරීම ඊ.ඒ. පව්ලි

එහෙත් ලංකාවේ ප්‍රතිබිම්බ, වාර්තා චිත්‍රපට ලෙසින් ඊට පෙර අවස්ථා දෙකක දී විදේශිකයින්ගේ අවධානයට පාත්‍ර වී ඇත. A Ramble Through Ceylon නම් 1904 දී රූපගත කළ චිත්‍රපටයක් ගැනත්, Curious Scenes in India නමින් ලංකාවේ දර්ශන ඇතුළත් ව 1921 දී නිම වූ චිත්‍රපටයක් ගැනත් වොෂින්ටන් කොංග්‍රස් පුස්තකාලයේ චිත්‍රපට සංරක්ෂණාගාර තොරතුරුවලින් කරුණු හෙළි වී ඇත. [3]

මිනිත්තු 10 ක පමණ ධාවන කාලයක් සහිත Ramble Through Ceylon එඩිසන් සමාගමේ නිෂ්පාදනයකි. ලංකාවේ ස්ථාන ගණනාවක රූපගත කෙරුණු Sacred Bo Tree, Show Cingalese, Woman Carrying Urns, Oxen pulling a Cart, Elephant rolling Logs and Resting in Pools of Water, Rice, Kandy, Namioya (නානුඔය) ආදී වශයෙන් එකිනෙකට වෙනස් තේමාවන් යටතේ වූ දර්ශන ගණනාවක එකතුවක් ලෙස මෙය සකස් වී තිබේ. එහෙත් සංස්කරණයේ දී ඉන්දියාව, බුරුමය හෝ වෙනත් පෙරදිග සාධක යැයි හඳුනාගත හැකි දර්ශන කිහිපයක් ද මේ අතරින් පතර අමුණා ඇත. ලංකාවේ භූගෝලීය හා සංස්කෘතික සීමා පිළිබඳ අල්ප වූ අවබෝධයක්, ලංකාව ඉන්දියාවේ ම කොටසක් ය යනුවෙන් ඇතැමුන් තුළ වූ මතය නිසාත් එම අත්වැරැද්ද සිදුවන්නට ඇතැයි සිතිය හැකි ය.



Ramble Through Ceylon රූපරාමුවක්

එසේ වුව ද Ramble Through Ceylon, පෙරදිග කලාපයේ පිහිටි ලංකාව නම් අපූර්ව, අද්භූත කලාපයක් හා එහි වෙසෙන යුරෝපයේ මෙන් නවීනත්වයට අනුගත වී ඇතැයි සැලකිය නොහෙන ජනතාවක් ගැනත් යම් පණිවිඩයක් බටහිර ලෝකයට රැගෙන යන්නට ඇත. මෙහි පිටපතක් ඇමරිකානු තානාපති කාර්යාලය මගින් මෑතක මෙරටට ගෙන්වා ගැනීමෙන් පසු ප්‍රදර්ශනය සඳහා ලබාගැනීමේ ප්‍රධාන ගැටලුව වූයේ ද ඉන් ලංකාව ගැන ප්‍රකට කෙරෙන අධිරාජ්‍යවාදී චින්තනයයි. මෙහි එක් තැනක 'Missing link' වශයෙන් සඳහන් ව ඇති, ගැටවරයින් තිදෙනෙකු වෙරළබඩ පොල් ගසකට නගින රූප ඛණ්ඩයක් ඇත. මානව

[3] Boyle, Rechard; Song of Ceylon, In Serendib Vol 1. No. 3, Issure May – June 1998, Chapman, Tom (Edi), Air Lanka Ltd, Colomo, p.16)

පරිණාමයේ අසම්බන්ධිත කාල වකවානුවක් පිළිබඳ ඉඟි කෙරෙන එම ප්‍රකාශය, මෙරට ජනතාව නිසියාකාර පරිණාමීය ක්‍රියාවලියකට බඳුන් නුවූ අශිෂ්ට පුද්ගල කොට්ඨාසයක් ය බඳු අදහසක් ජනිත කරයි. ඒ ගැන මෙරට ජනතාවගෙන් යම් කරකශ ප්‍රතිචාර අපේක්ෂා කළ බැවින් ඇමරිකානු තානාපති කාර්යාලය මෙය ප්‍රදර්ශනය පිළිබඳ එක්තරා පසුගාමී මතයක පිහිටා කටයුතු කළේ ය.

1947 දී විශ්වරංග මුවිටෝන් සමාගම පිහිටුවීම පිණිස ඉතාලියේ Cinecitta චිත්‍රාගාරයෙන් මෙරටට කැඳවූ ජුලියෝ පෙට්රෝනි (අධ්‍යක්ෂ), ෆෙඩ්රිකෝ සෙරා (ශබ්ද පරිපාලක) සහ ජෝර්ජියෝ කලාබ්‍රියා (රසායනාගාර පාලක) යන අය එකී සමාගම අහෝසි කරලීම හේතුවෙන් නිශ්චිත කාර්යභාරයකින් තොර ව මං මුලා වූහ. ඩී. එස්. සේනානායක අග්‍රාමාත්‍යවරයාගේ ආරාධනය පරිදි ඔවුන් විසින් රූපගත කරන ලද 1948 නිදහස් උළෙල ප්‍රථම වාර්තා චිත්‍රපටය ලෙස රජයේ චිත්‍රපට ඒකකය (GFU) ආරම්භයේ දී සංරක්ෂණය කෙරිණි. ඉන් අනතුරුව මෙරට නිපදවූ හා විදේශීය ප්‍රේක්ෂකයන් හමුවේ තිරගත කෙරුණු වාර්තා චිත්‍රපට (අපගේ විමසුමට අදාළ කාලසීමාවට අයත්) මතු දැක්වේ.

ඉතාලි ජාතික ජුලියෝ පෙට්රෝනි අධ්‍යක්ෂණය කළ චිත්‍රපට


New Horizons ඉංග්‍රීසි
මිමී. 35 කලු සුදු 1951
The Hill Capital ඉංග්‍රීසි
මිමී. 35 කලු සුදු 1950
Air Ceylon New Wings ඉංග්‍රීසි
මිමී. 35 කලු සුදු 1949
Among the Colonists ඉංග්‍රීසි
මිමී. 35 කලු සුදු 1947



*New Horizons රූප රාමුවක් (නව දිවිය)*

ඉතාලි ජාතික ෆෙඩ්රිකෝ සෙරා අධ්‍යක්ෂණය කළ චිත්‍රපට

Royal Mail ඉංග්‍රීසි 1953
Census ඉංග්‍රීසි 1952
Nursing Today ඉංග්‍රීසි 1955



*Heritage of Lanka*

බ්‍රිතාන්‍ය ජාතික රැල්ෆ් කීන් අධ්‍යක්ෂණය කළ චිත්‍රපට

Heritage of Lanka ඉංග්‍රීසි
මිමී. 35 කලු සුදු 1952
Nelungama ඉංග්‍රීසි
මිමී. 35 කලු සුදු 1953



*Nelungama*


බ්‍රිතාන්‍ය ජාතික ජෝර්ජ් ස්ටර්ඩි අධ්‍යක්ෂණය කළ චිත්‍රපට

Children in Need ඉංග්‍රීසි 1953
Battle Against Crime ඉංග්‍රීසි

ලෙස්ටර් ජේම්ස් පීරිස් අධ්‍යක්ෂණය කළ චිත්‍රපට

Sinhala Dance
මෙය ලෙස්ටර් එංගලන්තයේ පුවත්පත් කලාවේදියෙකු වශයෙන් කටයුතු කරන අවධියේ නිපදවනු ලැබූවකි.
ඉංග්‍රීසි මිමී. 16 කලු සුදු මි. 8 1950
Conquest in the Dry Zone
ඉංග්‍රීසි, මිමී. 16 කලු සුදු, මි. 14° 1954
Be Safe or be Sorry


ඉංග්‍රීසි, මිමී. 35 කලු සුදු, මි. 20° 1955



*Conquest in the Dry Zone*

ජෝර්ජ් වික්‍රමසිංහ (එල්. ජී. වික්‍රමසිංහ) අධ්‍යක්ෂණය කළ චිත්‍රපටි

Fishermen of Negombo
මිමී. 35 කලු සුදු, මි. 30 1952
Colombo Plan - 1952
Soldier of Ceylon
කලු සුදු, 1953
Order of the Yellow Robe - 1953



*Fishermen of Negombo*

මේවාට අමතර ව අධ්‍යක්ෂණය පිළිබඳ නිශ්චිත තොරතුරක් සඳහන් නොවන Opening of the Parliament (1950 විය යුතු ය.) යන කලු සුදු වාර්තා චිත්‍රපට ද 1955 ට පෙර නිෂ්පාදනය වී ඇත. ජෝර්ජ් වික්‍රමසිංහගේ Rebirth of a River Valley කෘතිය ද 1955 හෝ ඊට පෙර යැයි අනුමාන කළ හැකි ය.

ලක්දිව වාර්තා සිනමාවේ ආරම්භය විදේශීය දෘෂ්ටි කෝණයකින් ලාංකීය පරිසරය හා ජනසමාජය විමර්ශනය කරන්නට දරූ ප්‍රයත්නයක් ලෙස හඳුනාගත හැකිය.

අතිශය මානුෂික ස්වරූපයකින් ප්‍රස්තුත විෂය වෙත ප්‍රවේශ වීම එහි මුඛ්‍ය ලක්ෂණයයි. මෙයින් උපන් අව්‍යාජ ස්වරූපය චිත්‍රපටයේ ආත්මය බවට පත්වෙයි.[4]

ජුලියෝ පෙට්රෝනිගේ අධ්‍යක්ෂණයක් වන "නව දිවිය" (New Horizons) චිත්‍රපටය 1917 දී බ්‍රිතාන්‍යයේ සිනමා ශාලා තුන්දහසක පමණ ප්‍රදර්ශනය කළ බවට තොරතුරු ඇත. මෙය හත්වැනි පැරිස් සිනමා උළෙලේ හොඳ ම වාර්තා චිත්‍රපටය ලෙස ද සම්මානයට පාත්‍ර විය.[5]

දේශීය චිත්‍රපට ලෝලීන් ද, සිනමාව යනු කතා කිරීමේ කලාවක් පමණක් ම නොවන බව තේරුම් ගත්තේත්, චිත්‍රපට ප්‍රදර්ශනය ප්‍රචලිත වීම හේතුවෙනි. එය තොරතුරු සම්පාදන මාධ්‍යයක් ලෙස ද සමාජානුයෝජන ක්‍රමවේදයක් ලෙස ද ලාංකික සමාජය තුළ තහවුරු වෙමින් පැවතිණි.

රැල්ෆ් කීන්ගේ මෙහෙයවීම යටතේ 1956 සිට 1953 අතර, කාලය තුළ සිනමා වෑන් රථ මගින් මෙරට ගම්දනව් පුරා එළිමහන් චිත්‍රපට දර්ශන පැවැත්වීම වර්ධනය විය. 1952 වසරේ සිනමා ප්‍රදර්ශන වෑන් රථ 4 ක් මගින් මි.මී. 35 චිත්‍රපට ද එක් ප්‍රදර්ශන වෑන් රථයකින් මි.මී. 16 චිත්‍රපට ද ප්‍රදර්ශනය කොට ඇත. ඊට ඉලක්ක වූ ප්‍රේක්ෂක සංඛ්‍යාව 7,50,000 ලෙස ගණන් බලා ඇති අතර, චිත්‍රපට ප්‍රදර්ශන වාර 797 ක් පවත්වා තිබේ. [6]

1953 වසර තුළ පමණක් එලෙස චිත්‍රපට ප්‍රදර්ශන රථ මගින් පවත්වන ලද ප්‍රදර්ශන වාර ගණන 939 කි. එසේ ම රජයේ චිත්‍රපට අංශයෙන් තනනු ලැබූ චිත්‍රපට මේ අවධියේ බ්‍රිතාන්‍යය, ඇමරිකාව, කැනඩාව, ඉන්දියාව, පාකිස්ථානය, මියන්මාරය, ඕස්ට්‍රේලියාව, ඉන්දුනීසියාව, මලයාව, ඉරාකය, පින්ලන්තය යන රටවල ද ප්‍රදර්ශනය කොට ඇත.[7]

එනම් වාර්තා චිත්‍රපටය යනු ලාංකිකත්වය ලොවට රැගෙන ගිය ප්‍රවේගවත් සන්නිවේදන මාධ්‍යයක් බව සනාථ වේ. අපගේ විමසුමට පාත්‍ර වන කාලසීමාව තුළ නිෂ්පාදනය වූ වාර්තා චිත්‍රපට ලේඛනය පහත දැක්වේ.

---

[4] රත්න විභූෂණ, ඇෂ්ලි, විශිෂ්ට වාර්තා සම්ප්‍රදායක කේන්ද්‍රය, රජයේ චිත්‍රපට අංශය, සිනෙසිත් අංක 05, ජාතික කතෝලික සිනමා පර්ෂදය, කොළඹ 1986 පි. 43

[5] Ceylon Administration Reports – 1959 p. 5 - 6

[6] Ceylon Administration Reports – 1952 p. 09

[7] Ceylon Administration Reports – 1953 p. 09 - 10

1949 දී නිෂ්පාදිත වාර්තා චිත්‍රපට

1. First Anniversary of independence (නිදහස් දින පළමු සංවත්සරය)
2. Presentation of the Mace and Chair (සෙන්කෝලය සහ කතානායක පුටුව පරිත්‍යාග ) කිරීම
3. Air Ceylon's New Wings (ලංකා ගුවන් සේවයේ නව පියාපත්)
4. Inauguration of the New Town of Anuradhapura (අනුරාධපුර නව නගරය බිහිවේ.)
5. Departure of the Sanchi Relics (සාංචි ධාතූන් වහන්සේලා මෙරටින් වැඩම කිරීම)
6. Documentary of Kandy (කන්ද උඩරට
7. Commonwealth Foreign Minister's Conference (පොදු රාජ්‍ය මණ්ඩලීය විදේශ අමාත්‍ය සමුළුව)
8. ILO Conference (ජාත්‍යන්තර කම්කරු සංවිධාන සමුළුව)
9. A Ceylon Diary depicting some important events of 1949 [8]

1950 දී නිෂ්පාදිත වාර්තා චිත්‍රපට

1. The Hill Capital - කඳු රට අගනුවර (ජූලියෝ පෙට්රෝනි)
2. New Horizones - නව දිවිය (ජූලියෝ පෙට්රෝනි)
3. Pursuit of Learning- අධ්‍යාපනයේ දියුණුව (ජෝර්ජ් වික්‍රමසිංහ)
4. Milky Way කිරි බීමෙන් සනීපය ගෙන දෙයි (ජෝර්ජ් වික්‍රමසිංහ)
5. Modern Methods of Paddy - ගොයම් වගාවේ නව ක්‍රම සහ විධි (ජෝර්ජ් වික්‍රමසිංහ)
6. Namo Namo Matha - නමෝ නමෝ මාතා
7. Amongst the Colonists - ජනපදවාසීන් අතර[9]

1952 දී නිෂ්පාදිත වාර්තා චිත්‍රපට

1. Colombo Exhibition - කොළඹ ප්‍රදර්ශනය (ජෝර්ජ් වික්‍රමසිංහ)
2. Teacher of Tomorrow - හෙට දින ගුරුවරු (ජෝර්ජ් වික්‍රමසිංහ)
3. Fisherman of Negomno - මීගමුවේ මසුන් මරන්නෝ (ජෝර්ජ් වික්‍රමසිංහ)
4. Fight Against Salvinia - සැල්විනියාවට එරෙහි සටන (ජෝර්ජ් වික්‍රමසිංහ)
5. Heritage of Lanka - ලංකා උරුමය (රැල්ෆ් කීන්)
6. Census – සංගණනය (ෆෙඩ්රිකෝ සේරා)[10]

[8] Ceylon Administration Reports – 1949 p 07 - 08
[9] Ceylon Administration Reports – 1951 p 05 - 06
[10] Ceylon Administration Reports – 1952 p 06

1953 දී නිෂ්පාදිත වාර්තා චිත්‍රපට

1. Nelungama; A Story of New Lanka – නෙළුන්ගම (රැල්ෆ් කීන්)
2. Children in need - උපකාර අවශ්‍ය ළමයි (ජෝර්ජ් ස්ටුවර්ට්)
3. Order of the Yellow Robe - ක්ෂාය චීවරයක ධූරය (ජෝර්ජ් වික්‍රමසිංහ)
4. Conquest of the Dry Zone - වියළි කලාපය ජයගැනීම (ලෙස්ටර් ජේම්ස් පීරිස්)
5. Soldier of Ceylon - ලංකා සොල්දාදුවා (ජෝර්ජ් වික්‍රමසිංහ)
6. Royal Mail - රාජකීය තැපැල් සේවය (ෆෙඩ්රිකෝ සේරා)
7. The X-ray of the Diagnosis and Prevention of Tuberculosis - ක්ෂය රෝග මර්දනය (අර්වින් දසනායක)
8. Ceyllocrete - ප්‍රඥාසෝම හෙට්ටිආරච්චි)[11]

1954 දී නිෂ්පාදිත වාර්තා චිත්‍රපට

1. Queen Visit Ceylon - රැජින ලංකාවට පැමිණේ (ජෝර්ජ් වික්‍රමසිංහ)
2. Queen's Tour of Ceylon - රැජිනගේ ලංකා චාරිකාව (ජෝර්ජ් වික්‍රමසිංහ)
3. Asian Priministers' Conference – ආසියානු අගමැතිවරුන්ගේ සමුළුව (ජෝර්ජ් වික්‍රමසිංහ)[12]

1955 දී නිෂ්පාදිත වාර්තා චිත්‍රපට

1. Be Safe of Be Sorry - රැකෙනු නැත්නම් තැවෙනු (ලෙස්ටර් ජේම්ස් පීරිස්)
2. Migrant Fisherman - සංචාරක මසුන් මරන්නෝ (ප්‍රඥාසෝම හෙට්ටිආරච්චි
3. Battle Against Crime - අපරාධ මර්දන සටන (ජෝර්ජ් ස්ටුවර්ට්)[13]

1956 දී නිෂ්පාදිත වාර්තා චිත්‍රපට

1. Path of Proyers - රාජකීය කෘෂිකාර්මික හා ආර්ථික ප්‍රදර්ශනය
2. 25 Years of Service - 25 වසරක සේවය
3. Home for People - මිනිසුන් සඳහා නිවාස
4. Art and Architecture of Ceylon - ලංකාවේ කලා හා ගෘහ නිර්මාණ ශිල්පය
5. විසාකා ජපන් කුමරා හා කුමරිය ලංකාවට සැපත්වීම. [14]

---

[11] Ceylon Administration Reports – 1951 p 07 - 08
[12] Ceylon Administration Reports – 1954 p 04
[13] Ceylon Administration Reports – 1955 p 05-06
[14] Ceylon Administration Reports – 1956 p 07

මෙවක නිෂ්පාදිත වාර්තා චිත්‍රපට එකහෙළා ම විදේශීය ප්‍රේක්ෂකයින් ඉලක්ක කොටගෙන ඇතැයි ප්‍රකාශ කිරීම සාධාරණ නොවේ. දේශීය ප්‍රේක්ෂකයාට ද සන්නිවේදන මාධ්‍යයක් වශයෙන් බෙහෙවින් ආකර්ශනීය සහ ප්‍රබල බලපෑම් ඇතිකරලීමට චිත්‍රපටය භාවිත කිරීමට මෙරට ආණ්ඩුව උත්සුක වී ඇත. වාර්තා චිත්‍රපටවලට අමතර ව ආණ්ඩුවේ ප්‍රතිරූපය ගොඩනැංවෙන පරිදි සහ පොදු ජන අවශ්‍යතා ඉලක්ක කරගන්නා පරිදි "ප්‍රවෘත්ති චිත්‍රපට" (News reels) ද චිත්‍රපට සමග සිනමාහල්වල ප්‍රදර්ශනය කිරීමට විධිවිධාන යොදා තිබිණි.

ප්‍රවෘත්ති චිත්‍රපට සැමෙකක් ම පාහේ කාලීන වැදගත් සිදුවීම් පාදක කොටගෙන සකස් විය. චිත්‍රපට ශාලාවල බොහෝ දෙනා News Reels වශයෙන් මේවා හැඳින්වූහ. මෙම ප්‍රවෘත්ති චිත්‍රපට Ceylon News යන පොදු නාමය යටතේ නිර්මාණය කර තිබිණි.

උදා: 1950 Ceylon News 1-13
1951 - Ceylon News 14-15
1954 - Ceylon News 38-50

ඉංග්‍රීසි මාධ්‍යයෙන් තැනුණු Ceylon News චිත්‍රපට මාලාවේ ඇතැම් ඒවා පසුව සිංහල හඬකවා ඇත. එක් චිත්‍රපටයක් විවිධ සිදුවීම් ඇතුළත් රූප මාලා කිහිපයකින් සමන්විත ය.

උදා: Ceylon News No 01 (ඉංග්‍රීසි)

1. Sacred relics leave for Burma
2. Independence Day Celebrations – 1950
3. Ceylon Havoc in Gintota
4. Gussie Moran and Pat Todd at the Garden Club
5. Independence March by Sacha and his Bank

Ceylon News No 06 (සිංහල, දෙමළ, ඉංග්‍රීසි)

1. Scenes on Arrival of Fatima Statue
2. Pineapple Canning Demostrated by Marketing Department
3. Ceylon Olympic Swimmer in Training

ඉහත සඳහන් වාර්තා චිත්‍රපට මෙන් ම ප්‍රවෘත්ති චිත්‍රපට මගින් තත්කාලීන ලාංකික ජන ජීවිත ආකර්ශනීය ලීලාවකින් පිළිබිඹු වන බව නිදර්ශන පරීක්ෂා කිරීමේ දී පෙනී යන කරුණකි. එසේ ම ජාතික වශයෙන් ඉතා වැදගත් සිදුවීම් ද වාර්තා සහ ප්‍රවෘත්ති චිත්‍රපට හේතුවෙන් අනාගතය උදෙසා සුරක්ෂිත කරනු ලැබ ඇත. බොහෝ අහඹු සිදුවීම් රැසකින් ගහන ආරම්භයකින් පසු වුව ද වාර්තා චිත්‍රපටකරණය මෙරට තහවුරු වීම මෑත ඉතිහාසය පිළිබඳ යථාර්ථවත් හා නිරවද්‍ය ශ්‍රව්‍ය දෘශ්‍ය තොරතුරු සම්පාදන කාර්යයන් සඳහා මුල් වූ බව නිගමනය කළ හැකි ය.